අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ යොමුව<br>எனது குறிப்பு<br>My Ref. | PTF/01/Circular /01 | ඔබේ යොමුව<br>உமது குறிப்பு<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2020.05.03 |

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් සහ**

**සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත**

**<u>සමාජ ප්‍රතිලාභ වැඩසටහන් යටතේ සුදුසුකම් ලැබූ ප්‍රතිලාභීන් සඳහා රු.5000/-ක දීමනාව ගෙවීම - 2020 මැයි</u>**

සමාජ ප්‍රතිලාභී වැඩසටහන් යටතේ වැඩිහිටි දීමනා, සියවස් පූර්ණ වැඩිහිටි දීමනා, ආබාධිත දීමනා, වකුගඩු දීමනා, ගොවි විශ්‍රාම වැටුප් හා ධීවර විශ්‍රාම වැටුප් ලබන ප්‍රතිලාභීන්ට 2020 මැයි මසට හිමි දීමනාව ලෙසින් අප්‍රේල් මාසයේ ගෙවූ ආකාරයට ම රු.5000/ ක දීමනාවක් ගෙවීමට රජය විසින් තීරණය කර ඇත.

02. ඒ අනුව, ඉහත සඳහන් සමාජ ප්‍රතිලාභී වැඩසටහන්වලට අයත් ස්ථාවර ප්‍රතිලාභීන් හා පොරොත්තු ලේඛනගත ප්‍රතිලාභීන් යන දෙකොටසට ම මැයි මාසය සඳහා රු.5000/ බැගින් ලබා දීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

03. ඔබ විසින් 2020 අප්‍රේල් මස දීමනා ගෙවීම ඉතා ප්‍රසංශනීය අයුරින් ඉටු කළ බව නිරීක්ෂණය වූ බැවින්, 2020 මැයි මාසයේ දීමනා ගෙවීම් ද ඒ ආකාරයෙන් ම සිදු කරනු ඇතැයි උදෙක් ම අපේක්ෂා කරමි.

**ගාමිණී එස්.සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්

**පිටපත් :**

කාරුණික දැනගැනීම සඳහා:

1. ජනාධිපති ලේකම්
2. අමාත්‍ය මණ්ඩල ලේකම්
3. විගණකාධිපති

අවශ්‍ය කටයුතු සඳහා:

4. ලේකම්, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය
5. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
6. ලේකම්, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය
7. සාමාන්‍යාධිකාරී, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
8. අධ්‍යක්ෂ, ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය
9. අධ්‍යක්ෂ, ආබාධ සහිත තැනැත්තන් පිළිබඳ මහලේකම් කාර්යාලය